සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 6 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය Time: පැය 02 |

- **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,
    1. ඉ  2. උ  3. අ  4. එ

02. පහත වචනවල ස්වර හා ව්‍යඤ්ජන නිසි ලෙස වෙන් කොට දක්වා ඇති පිළිතුර වන්නේ,
    1. කුරුල්ලා - ක් + උ + ර් + උ + ල් + ආ
    2. උදැල්ල - උ + ද් + ඇ + ල් + ල් + අ
    3. විනෝදය - ව් + ඉ + න් + ද් + අ + ය් + අ
    4. පිනි - පි + න් + ඉ

03. 'රුමේනියා' යන වචනයේ යෙදී ඇති පිල්ලම් පිළිවෙළින්,
    1. කෙටි පාපිල්ල, කොම්බුව, ඉස්පිල්ල, ඇලපිල්ල
    2. කෙටි ඇදය, කොම්බුව හා දීර්ඝත්ව සලකුණ, ඉස්පිල්ල, ඇලපිල්ල
    3. කෙටි ඇදය, කොම්බුව, ඇලපිල්ල, ඉස්පිල්ල
    4. කෙටි පාපිල්ල, කොම්බුව හා දීර්ඝත්ව සලකුණ, ඉස්පිල්ල, ඇලපිල්ල

04. 'වල' යන පදයට සමාන පදයක් නොවන්නේ,
    1. කැලෑව  2. වනාන්තරය  3. අරණ  4. පතල

05. 'නිශ්චල' යන පදයට විරුද්ධ පදය වන්නේ,
    1. චංචල  2. ස්ථිර  3. නිසසල  4. නිහඬ

06. උක්ත නාම පද යුගලයක් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
    1. මම, ඔවුන්  2. අපි, කුරුල්ලෝ
    3. ගොවියෙකු, නුඹ  4. ළමයින්, දැරියක

07. වෛද්‍යවරු <u>රෝගීන්</u> සුවපත් කරති. මෙම වාක්‍යයේ ඉරි ඇඳි පදය,
    1. ආඛ්‍යාතයකි.  2. කර්ම පදයකි.
    3. උක්ත පදයකි.  4. විශේෂණ පදයකි.

08. මධ්‍යම පුරුෂ අතීත කාල ඒක වචන ක්‍රියා පදයකි.

1. ගියෙහු 2. ගියහ 3. යති 4. ගියෙහි

09. පොලිස් නිළධාරිහු අනතුර සිදු වූ ස්ථානයට ගියහ.
යන වාක්‍යයේ ඇතුළත් විශේෂණ පදය වන්නේ,

1. නිළධාරිහු 2. පොලිස් 3. අනතුර 4. ස්ථානයට

10. පහත දැක්වෙන වචනවල මහප්‍රාණ අක්ෂර පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. ප්‍රබන්ධ, පීඨය, ස්ථානය, භාරතය 2. ගුළු, සජ්ඣායනා, ඝනකය, දක්ෂිණ
3. ආරුළු, සංඛ්‍යාව, පශ්චිම, ධර්මය 4. අවබෝධය, ඡායාව, ස්ථිර, ප්‍රස්තාර

11. සඤ්ඤක අක්ෂරයක් යෙදී නැති පිළිතුර තෝරන්න.

1. තරඟය 2. අඹර 3. සංඥාව 4. හඳහන

12. කෙටි විරාමයක් දැක්වීමට යෙදෙයි.

1. කොමාව 2. විස්මයාදී ලකුණ
3. තිත 4. යුගල උඩු කොමාව

• **13-14 ප්‍රශ්නවල ඉරි ඇඳි පදය සඳහා වඩාත් නිවැරදි අර්ථය තෝරන්න.**

13. ''මේ වනයෙහි අමනුෂ්‍යයින් අරක්ගත් **පුෂ්කරණීහු** වෙති.

1. ගංගා 2. විල් 3. පොකුණු 4. ජලාශ

14. <u>විවරය</u> තුළින් කළු වලාවක් නික්මිණි.

1. වනය 2. සිදුර 3. සිවුර 4. වෘත්තය

15. ''අලි උවදුර' පාඩම උපුටාගත් ග්‍රන්ථය වන්නේ,

1. මැකී ගිය දඩමං 2. වන සරණ
3. කියවන නුවණ 4. හත්පණ

16. ''ඇවිදින කොළය'' පාඩම උපුටාගත් කෘතියේ රචකයා වනුයේ,

1. කුමාරතුංග මුනිදාස මහතා 2. අභය හේවාවසම් මහතා
3. මාර්ටින් වික්‍රමසිංහ මහතා 4. ඒ.පී. ගුණරත්න මහතා

• **18 - 19 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

17. කම්කරුවෝ උදෑසනින් සේවයට ..........................

1. ගියෙමු 2. ගියේය 3. යයි 4. ගියහ

18. නුඹලා තරගය ජයග්‍රහණය ..........................

1. කළෙහි 2. කළෙහු 3. කරති 4. කළෝය.

19. ලන්දේසීහු, එපමණ ප්‍රණීත ආහාරයක් මිනිස් අතකින් සෑදිය නොහැකි බව ප්‍රකාශ කළේ කුමන ආහාරයක් ගැනද ?

1. අග්ගලා 2. වණ්ඩු 3. අලුවා 4. කැවුම්

20. වැවක, දිය රැල්ලෙන් වැව් බැම්ම ආරක්ෂා වීම සඳහා කළ නිර්මාණය වන්නේ,

1. රළපනාව 2. බිසෝකොටුව 3. සොරොව්ව 4. පිටවාන

## II කොටස

- **01 සහ 02, 03 ප්‍රශ්න අනිවාර්ය වේ.**
- **04, 05, 06, 07 යන ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න. නිවැරදිව අංක යොදන්න.**

1). පන්ති කාමරයේදී විවිධ ශෛලියෙන් කියවීමේ තරගය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). කියවීම සඳහා යොදාගත් පාඩම් දෙකක නම ලියන්න. (ල.02)
(ii). කියවීමේ ශෛලීන් දෙක නම් කරන්න. (ල.02)
(iii). පාඩම කියවීමට පෙර ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ල.04)
(iv). කියවීමේ පුරුද්ද නිසා ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.04)
(v). කියවීමේ තරගය ජයග්‍රහණය සඳහා ඔබ කණ්ඩායම ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල.04)

(ලකුණු 16)

2). පහත සඳහන් මාතෘකා ඇසුරින් එකක් තෝරාගෙන වචන 125 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

(i). හොඳ සිරිත් අගයමු.
(ii). රස ගුණ පිරි හෙළ බොජුන්
(iii). මිහිකත රකිනා තුරුලිය සුරකිමු.
(iv). පොත් කියවමු ... දැනුම වඩමු ...
(v). මම ගං වතුරකට මැදිවීමි.

(ලකුණු 14)

3). තමා පෙනී සිටි චිත්‍ර තරගයකින් ප්‍රථම ස්ථානය ලැබූ බව සඳහන් කර ඔබ පාසලෙන් ඉවත් වී වෙනත් පාසලක සේවයට ගිය චිත්‍ර ගුරුතුමියට යැවීමට ලිපියක් ලියන්න.

***නැතහොත්***

කලක් රෝගාතුරව පසුවන ඔබගේ මිතුරාට/මිතුරියට ඉක්මන් සුව පතා යැවීමට සුදුසු සුබපැතුම් පතක් සකස් කරන්න.

(ලකුණු 10)

4). පහත කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටු කැලේ ගාලෙ නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
……………………………………………………..

(i). කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ii). මෙහි සඳහන් කන්දක නම ලියන්න.
(iii). මෙම කවිය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයට ද ?
(iv). ඔබ දන්නා වෙනත් ජනකවි වර්ග දෙකක් ලියන්න.
(v). මෙම කවියේ 'හපුතලේ කන්ද දැකලා බඩ දනවා' යන කවි පදයෙන් අදහස් කළේ කුමක්ද?

(ලකුණු 2x5=10)

5). පහත ප්‍රකාශ කවුරුන් කා හට ප්‍රකාශ කළේ දැයි ලියා වගුව සම්පූර්ණ කරන්න.

(i). ''හා හා මම එහෙමත් කරනවද ?''

(ii). ''එදා නම් තොපට පින් දෙන්නටද මට සිහිමඳ වියැ''

(iii). ''නුඹ වහන්සේ එනකම් බලා උනුම්හ''

(iv). ''මේවා ගස්වලින් කඩාගන්නා දෙයක්දැ''

(v). ''ගොඩින් පැනගත්තා - හුගක් ළඟ හින්දා''

| | කා විසින් | කා හටද |
|---|---|---|
| i | | |
| ii | | |
| iii | | |
| iv | | |
| v | | |

(ලකුණු 2x5=10)

6). පහත සඳහන වාක්‍යවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(i). අවුකන ප්‍රතිමාව, කළු ගලින් ……………… විශිෂ්ට නිර්මාණයකි. (කල/කළ)

(ii). මහ ……………… දෙදරවමින් හූ හඬ පැතිර ගියේ ය. (වනය/වණය)

(iii). අනපේක්ෂිතව වැදුණු පහරින් මිනිසා ……………… විය. (උරණ/උරන)

(iv). වලාකුළු අතරින් ……………… හඳ නැගී එයි. (අඬ/අඩ)

(v). ……………… දරුවා බටනළාව වාදනය කරයි. (අඳ/අද)

(ලකුණු 2x5=10)

7). පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වියළි කලාපයේ ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන්නේ හේන් ගොවිතැනයි. වගා කළ යුතු හේන් වර්ගය සහ බිම් තීරු බෙදා ගැනීම සිදුවූයේ ගම් වැසියන් සියලු දෙනාගේ සම්මුතියෙනි. දැතේ සවි ශක්තිය තිබෙන ගැමියන්ට අලුතින් වගා කරන 'නවදැලි හේන්' ලැබුණු අතර වයෝවෘද්ධ හෝ රෝගී වූ අයට හේන් කනත්තක් කොටා වගා කිරීමට ඉඩ දෙන ලදී. එසේම ගැමියා සතුන්ට දැක්වූයේ නොමද කරුණාවකි. ඒ නිසාම කෘෂි කර්මාන්තයේදී කුරුලු කොබෙයියන් උදෙසා 'කුරුලු පාලුව' නමැති බිම් කොටසක් වෙන් කිරීම ගොවියාගේ සිරිත විය.

(i). වියළි කලාපයේ බහුලව දක්නට ලැබෙන ගොවිතැන් ක්‍රමය කුමක්ද ?

(ii). එම ගොවීන් හේන් වර්ගය හා බිම් තීරු බෙදා ගත්තේ කෙසේද ?

(iii). අලුතින් වගා කරන හේන හැඳින්වූ නම කුමක්ද ?

(iv). කුරුලු කොබෙයියන් වෙනුවෙන් වෙන් වූ බිම් කොටස හැඳින්වූ නම කුමක්ද ?

(v). පහත වචනවල අර්ථය ලියන්න.

අ). සම්මුතිය -

ආ). වයෝවෘද්ධ - (ලකුණු 2x5=10)